සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

08 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ලංකාවේ ආරම්භක වාරි කර්මාන්තය ලෙස හඳුනාගෙන ඇති අභය වැව වර්තමානයේ දී හඳුන්වන්නේ,

(i) ජය වැව නමිනි (ii) තිසාවැව නමිනි

(iii) බසවක්කුලම නමිනි (iv) ගාමිණී වැව නමිනි

02 ස්වාභාවික ගල්තලාවක් මත වේල්ලක් බැඳ නිර්මාණය කෙරුණු තේක්කම් අමුණ මින් කුමන ඔය හරහා බඳින ලද්දක් ද?

(i) කලා ඔය (ii) යාන් ඔය (iii) මල්වතු ඔය (iv) මී ඔය

03 මධ්‍යතන යුගයේ ඉතාලියේ බිහි වූ විශ්ව විද්‍යාලයක් වන්නේ මින් කුමක් ද?

(i) ඔක්ස්ෆර්ඩ් (ii) පැරිස් (iii) කේම්බ්‍රිජ් (iv) බොලොඤ්ඤා

04 උඩරට රාජධානියේ ආරම්භක රජතුමා ලෙස සැලකෙන්නේ,

(i) කරල්ලියැද්දේ බණ්ඩාර රජුය (ii) සේනාසම්මත වික්‍රමබාහු රජුය

(iii) ජයවීර බණ්ඩාර රජුය (iv) යමසිංහ බණ්ඩාර රජුය

05 දළදා මාළිගාවට "පත්තිරිප්පුව" නම් විශේෂාංගය ඇතුළත් කළ රජු වන්නේ මින් කවරෙක් ද?

(i) කීර්ති ශ්‍රී රාජසිංහ රජුය (ii) පළමුවන විමලධර්මසූරිය රජුය

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුය (iv) දෙවන විමලධර්මසූරිය රජුය

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 ජය ගඟ හෙවත් යෝධ ඇළ පළමුවන අග්බෝ රජු විසින් කරවන ලදී. ( )

07 මහා මේඝ වන උයන මුටසිව රජතුමා විසින් කරවන ලද ලංකාවේ පළමුවන වනෝද්‍යානයයි. ( )

08 දැනට ඉතිරිව ඇති කලාත්මක වටදාගෙයක් ලෙස සැලකෙන්නේ මැදිරිගිරිය වටදාගෙයයි. ( )

09 ජොහැන්නස් ගුටෙන් බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයා ගන්නා ලදී. ( )

10 රාජාධිරාජසිංහ රජු විසින් වැලිවිට සරණංකර හිමියන් සංඝරාජ පදවියට පත් කරන ලදී. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා තිත් ඉර මත ලියන්න.**

11 ඉංග්‍රීසින් විසින් අත් අඩංගුවට ගන්නා ලද ශ්‍රී වික්‍රම රාජ සිංහ රජු ඉන්දියාවේ .............................................. රැගෙන යන ලදි.

12 ශ්‍රී දළදා පෙරහැර වාර්ෂිකව පැවැත්වීම ආරම්භ කරන ලද්දේ .............................................. රජතුමා විසිනි.

13 නායක්කර් වංශිකයෝ පළමු වරට උඩරට බලයට පැමිණියේ .............................................. රජතුමාගෙන් පසුවය.

14 රජරට ශිෂ්ටාචාර සමයට අයත් කලාත්මක ම බෝධිඝරය වන්නේ.............................................. බෝධිඝරයයි.

15 ....................................................... විශ්ව විද්‍යාලය මධ්‍යතන යුගය අවසානයේ එංගලන්තයේ බිහි වූ උසස් අධ්‍යාපන ආයතනයකි.

(සෙනරත්, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ, ගෝව, වෙල්ලෝරය, කීර්ති ශ්‍රී රාජසිංහ, නිල්ලක්කගම, පාදුවා, කේම්බ්‍රිජ්, කණ්ඨක චෛත්‍ය)

- **අංක 16 - 20 දක්වා 'A' තීරුවේ සඳහන් තොරතුරු හා සම්බන්ධ පිළිතුර 'B' තීරුවෙන් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16

| A | B |
|---|---|
| 1. මින්නේරි වැව | A - බානු වාපී |
| 2. හුරුළු වැව | B - මණිහිර වාපී |
| 3. මහකනදරා වැව | C - ජල්ලුර වාපී |
| 4. මහවිලච්චිය වැව | D - මයෙත් වාපී |

(i) DCBA (ii) BDAC (iii) BCAD (iv) CBDA

17

| A | B |
|---|---|
| 1. කොනප්පු බණ්ඩාර | A - සෙනරත් |
| 2. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ | B - සේනාසම්මත වික්‍රමබාහු |
| 3. දෙවන රාජසිංහ | C - වීර සුන්දර බණ්ඩාර |
| 4. ජයවීර බණ්ඩාර | D - දෙවන විමලධර්ම සූරිය |

(i) DBCA (ii) ADBC (iii) CBAD (iv) CDAB

18

| A | B |
|---|---|
| 1. බුරුමයෙන් උපසම්පදාව ගෙනඒම | A - දෙවන රාජසිංහ රජු |
| 2. ගන්නොරුව සටන ජයගැනීම | B - කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| 3. සියම් නිකායේ ආරම්භය | C - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු |
| 4. 'කිරි මුහුද' වැව කරවීම | D - I වන විමලධර්මසූරිය රජු |

(i) DABC (ii) BCDA (iii) ABDC (iv) BACD

19

| A | B |
|---|---|
| 1. ආලාහන පිරිවෙන | A - ලී කැටයම් |
| 2. ඇම්බැක්කේ | B - කුට්ටම් පොකුණ |
| 3. සීගිරිය | C - ආරෝග්‍යශාලා |
| 4. අභය ගිරිය | D - ජල උද්‍යාන |

(i) ADBC (ii) DCAB (iii) CADB (iv) BACD

20

| A | B |
|---|---|
| 1. මිනිසා සහ අශ්ව හිස | A - දෑදිගම |
| 2. කොට වෙහෙර | B - වෙහෙරගල |
| 3. අවලෝකිතේශ්වර බෝසත් පිළිමය | C - මහනුවර |
| 4. ටැම්පිට විහාර | D - ඉසුරුමුණිය |

(i) CDBA (ii) BCDA (iii) ABDC (iv) DABC

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**



01. A. (i) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) එය පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයක ද?

(iii) කුමන අවශ්‍යතාවක් සඳහා මෙය නිර්මාණය කලේ ද?

(iv) මෙම නිර්මාණයේ වහලය සකස් කළේ කුමන හැඩයකින් ද? (ල. 04)



B (i) මෙම පින්තූරය හඳුනාගෙන නම් කරන්න.

(ii) මෙය නිර්මාණය වූයේ කුමන රාජධානි සමයේ ද?

(iii) මෙය කුමන විහාර සංකීර්ණයකට අයත් වේද?

(iv) මෙය ඉදිකර ඇත්තේ කුමන අරමුණක් ඉටුකර ගැනීමට ද? (ල. 04)




C (i) මෙම පින්තූරයේ දැක්වෙන රජතුමා නම් කරන්න.

(ii) රජවීමට පෙර ඔහුගේ නම කුමක් ද?

(iii) මොහු කුමන රජ පෙළපතකට අයත් ද?

(iv) මොහුට රජවීමට සහය වූ මහ අධිකාරම්වරයා නම් කරන්න. (ල. 04)

D දී ඇති උපකාරක පද යොදා ගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට
1. රජරට පිහිටි පැරණි පොකුණකි.
2. තිසාවැවේ ජලයෙන් පෝෂණය වූ ජල උද්‍යානයකි.

පහළට
3. කාලිංග මාඝ විසින් විනාශ කළ රාජධානියයි.
4. උඩරට රාජ්‍ය සමයේ මෙරටට ආනයනය කළ වෙළඳ ද්‍රව්‍යකි.

(ල. 04)

(4 × 4 = 16)

02. (i) අනුරාධපුර රාජ්‍ය සමයේ මහ වැව් තැනවූ රජවරු තිදෙනෙක් සඳහන් කරන්න. (ල. 03)

(ii) පහත දැක්වෙන, වැවක ප්‍රධාන අංගවලින් ඉටුවන කාර්යය කෙටියෙන් දක්වන්න.

1. සොරොව්ව - 2. බිසෝ කොටුව -

3. රළපනාව - 4. පිටවාන - (ල. 04)

(iii) විශාල වැව් තැනවීම නිසා ලාංකිකයින් ලබාගත් ජයග්‍රහන දෙකක් දක්වන්න. (ල. 04)

03. (i) අතීතයේ ලෝහ කර්මාන්තය දියුණුව පැවතුණි. ලෝහ කර්මාන්තයේ නියැලුණු පහත නම් වලින් හඳුන්වන පුද්ගලයන් නම් කරන්න.

1. තඹර 2. කබර 3. තොපෂ (ල. 03)

(ii) විවිධ කාර්යයන් සඳහා අතීතයේ තැනවූ පොකුණු වර්ග 04 ක් සඳහන් කරන්න. (ල. 04)

(iii) ජල උද්‍යානවල ඇතුලත් කැපී පෙනෙන ලක්‍ෂණ දෙකක් දක්වන්න. (ල. 04)

04. (i) පහත දක්වෙන දාගැබ් ඉදිකළ රජවරු නම් කරන්න.

1. ථූපාරාමය -

2. ජේතවනාරාමය -

3. දෙමළ මහ සෑය - (ල. 03)

(ii) රජරට ශිෂ්ටාචාරයේ ශේෂ වී ඇති ආගමික නොවන ගොඩනැගිලි විශේෂ හතරක් සඳහන් කරන්න. (ල. 04)

(iii) පහත දක්වෙන නිර්මාණවලට උදාහරණ එක බැගින් සපයන්න.

1. අනුරාධපුර නගරයෙන් බැහැරව ඉදිකළ චෛත්‍යයක් -

2. මැදිරිගිරිය හැර වටදාගෙය සහිත චෛත්‍යයක් -

3. පුරාණ ආරෝග්‍යශාලාවක් පිහිටි ස්ථානයක් -

4. බෝධිසත්ව, ප්‍රතිමාවක් පිහිටි ස්ථානයක් - (ල. 04)

05. (i) මහනුවර රාජධානිය හැඳින්වූ වෙනත් නම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

(ii) පහත දක්වෙන විස්තරයට අදාල රජවරුන් නම් කරන්න.

1. උඩරට රාජධානියේ මුල්ම රජතුමා -

2. අවසන් සිංහල රජතුමා -

3. ශ්‍රී ලංකාවේ අවසාන රජතුමා -

4. මහා අස්ථාන කුමරු - (ල. 04)

(iii) පළමුවෙනි විමලධර්මසූරිය රජතුමාගෙන් ඉටු වූ සේවාවන් හතරක් දක්වන්න. (ල. 04)

06. (i) පුනරුද සමයේ පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ නව සොයා ගැනීම් සිදුකල පුද්ගලයකු බැගින් නම් කරන්න.

1. චිත්‍ර කලාව - 2. ප්‍රතිමා කලාව -

3. ගෘහ නිර්මාණ - (ල. 03)

(ii) ක්‍රි. ව. 14 සහ 16 වන සියවස් අතර යුරෝපයේ ශාස්ත්‍රීය, ආගමික, හා විද්‍යාත්මක ක්ෂේත්‍ර වල පුලුල් පරිවර්තනයක් (පුනරුදය) ඇතිවීම කෙරෙහි බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ල. 04)

(iii) යුරෝපයේ විවිධ කලා නිර්මාණ පුනරුද සමයට පෙර අවධියේ හා පුනරුද සමයෙන් පසු අවධියේ බිහිවී ඇත. මේ අනුව පුනරුද සමයට පෙර හා පසු අවධිවල නිර්මාණය වූ කලා නිර්මාණ ඔබ දකින වෙනස්කම් දෙක බැගින් දක්වන්න.

| පුනරුදයට පෙර අවධිය | පුනරුදයට පසු අවධිය |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |

(ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (iii) 02. (i) 03. (iv) 04. (ii) 05.(iii) 06. ( ✗ ) 07. ( ✓ ) 08. ( ✓ ) 09. ( ✓ ) 10. ( ✗ )
11. වෙල්ලෝරයට 12. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 13. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු 14. නිල්ලක්කගම
15. කේම්බ්‍රිජ් 16. (iii) 17. (iv) 18. (i) 19. (iii) 20. (iv) (2 x 20 = ල. 40)

## II කොටස

01. A (i) මැදිරිගිරිය වටදාගෙය (ii) මැදිරිගිරිය (iii) චෛත්‍යය ආවරණය කිරීම සඳහා (iv) කලුගල් (ල. 04)
B (i) කුට්ටම් පොකුණ (ii)අනුරාධපුර (iii) අභයගිරිය
(iv) භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා අලංකාරය, පරිසරය සිසිල් කිරීම. (ල. 04)
C (i) ශ්‍රී වික්‍රම රාජසිංහ (ii) කන්නසාමි (iii) නායක්කර් (iv) පිළිමතලාවේ මහ අධිකාරම් (ල. 04)
D

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 කු | මා | ර | 3 පො | කු | ණ |
| | | | ළො | | |
| | | 2 ර | න් | ම | 4 සු |
| | | | න | | ව |
| | | | රු | | ඳ |
| | | | ව | | වි |
| | | | | | ළ |
| | | | | | වු |
| | | | | | න් |

(ල. 04)

02. (i) වසභ, මහසෙන්, ධාතුසේන, I අග්බෝ, II අග්බෝ (ල. 03)
(ii) 1. වැවේ ජලය මුදාහැරීම
2. සොරොව්වෙන් ජලය මුදාහැරීමේ දී බැම්මට ඇතිවන පීඩනය වැළැක්වීම
3. වැව් බැම්ම සේදීයාම වැළැක්වීමට බැම්මේ ඇතුළු පැත්තේ අතුරා ඇති කළුගල් ආස්තරණය
4. වැවේ අතිරික්ත ජලය පිට කිරීම (ල. 04)
(iii) 1. දිගු නියඟ වලදී ජල හිඟය අවම කර ගැනීම
2. විශාල වැව්වල ජලය ඇල මාර්ග ඔස්සේ කුඩා වැව් වලට ලබා ගැනීම
3. ගං වතුර පාලනයට
4. දිගු ඇළ මාර්ග තැනීමේ ශිල්පීය ක්‍රම දියුණු වීම (ල. 04)

03. (i) 1. තඹර - තඹකරු 2. කබර - ලෝහ වැඩ කරන්නන් 3. තොපෂ - බෙලෙක් වැඩ කරන්නා (ල. 03)
(ii) කුට්ටම් පොකුණ / රන්මසු උයනේ පොකුණු / කුමාර පොකුණ / නෙලුම් පොකුණ / ඇත් පොකුණ (ල. 04)
(iii) 1. භූමියට පරිසරයට ගැලපෙන ලෙස සැලසුම් කිරීම. 2. සැලසුම් කළ මාර්ග පද්ධතියක් තනවා තිබීම
3. ජල කානු, පොකුණු, ජලමල්, ආදියෙන් අලංකාර කර තිබීම
4. එළිමහන් ගෙවල්, විවේක ස්ථාන ආශ්‍රිතව ගස්වැල් වලින් අලංකාර කිරීම
5. උද්‍යාන පාලකයන් මගින් උද්‍යාන අලංකාර කිරීම. (ල. 04)

04. (i) 1. ථූපාරාමය - දේවානම්පියතිස්ස 2. ජේතවනාරාමය - මහසෙන් 3. දෙමළ මහ සෑය - මහ පරාක්‍රම බාහු(ල. 03)
(ii) රජමාළිගා / බලකොටු / ආරෝග්‍යශාලා / නිවාස / වැසිකිළි, කැසිකිළි (ල. 04)
(iii) 1. සේරුවිල / සෝමාවතිය / තිස්ස මහාරාමය / මැදිරිගිරිය / දීඝවාපිය 2. ථූපාරාමය / ලංකාරාමය /අම්බස්තලය / තිරියාය3. මැදිරිගිරිය / මිහින්තලය / පොළොන්නරුව / ආලාහන පිරිවෙන 4. දඹේගොඩ / බුදුරුවගල / කුෂ්ටරාජගල / යටාල වෙහෙර (ල. 03)

05. (i) සෙංකඩගල පුර / කන්ද උඩරට, උඩරට, කන්දෙ නුවර (ල. 03)
(ii)1. සේනා සම්මත වික්‍රමබාහු 2. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ 3. ශ්‍රී වික්‍රම රාජ සිංහ 4. II රාජසිංහ (ල. 04)
(iii) 1. අලුත්රජ පෙලපතක් ආරම්භ කිරීම 2. සීතාවක බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම
3. පෘතුගීසින්ගෙන් උඩරට නිදහස් කර ගැනීම 4. බුරුමයෙන් උපසම්පදාව ගෙනඒම
5. දෙල්ගමු විහාරයෙන් දළදාව මහනුවරට වැඩමවා තැන්පත් කිරීම (ල. 04)

06. (i) 1. චිත්‍රකලාව - ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ඇන්ජිලෝ 2. ප්‍රතිමා කලාව - මයිකල් ඇන්ජිලෝ, ඩොනෙටෙලෝ
3. ගෘහ නිර්මාණ - රෆායල්, මයිකල් ඇන්ජිලෝ (ල. 03)
(ii) 1. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කින් අතට පත්වීම 2. වෙළඳාම දියුණුවීම 3. ධනවතුන් පිරිසක් බිහිවීම
4. බුද්ධි ප්‍රබෝධය (ල. 04)
(iii) **පුනරුදයට පෙර අවධිය** 1. ආගමික මුහුණුවරක් ගැනීම 2. ක්‍රිස්තු චරිතයේ අවස්ථා වස්තු විෂය වීම 3. ශිල්ප ශ්‍රේණි මට්ටමින් නිර්මාණ බිහිවීම 4. පල්ලියේ අනුග්‍රහය මත නිර්මාණ බිහිවීම 5. ආගමික භක්තිය මූලික වීම. 6. ස්වාධීන නිර්මාණවලට ඉඩක් නොවීම
**පුනරුදයට පෙර අවධිය** 1. ලෞකිකත්වයට මූලිකත්වය ලැබීම 2. ප්‍රභූ සහ ධනවත් පවුල් වස්තු විෂය කර ගැනීම 3. නිර්මාණ කතෘගේ නමින් එළි දැක්වීම 4. විවිධ ධනවතුන් අනුග්‍රහ දැක්වීම 5. රසවින්දනය මූලික පරමාර්ථය වීම. (ල. 04)